### පළමුවැනි කොටස

# 1978 ආර්ථික ප්‍රගතිය, ප්‍රශ්න හා ප්‍රතිපත්ති

## හැඳින්වීම

ශ්‍රී ලංකා ආර්ථිකය 1978 වසරේදී සියයට 8·2 ක විශිෂ්ට වර්ධනයක් විදහා දැක්විය. මෙම වර්ධනය ඉකුත් වසරේදී දක්නට ලැබුණු සියයට 4·4 ක වර්ධන වේගය මෙන් දෙගුණයක් පමණ විය. ඒ අතර, එය මෑත වර්ෂවලදී මෙරට වාර්තාගතවී ඇති උසස්ම වර්ධන වේගය වන 1968 දී දක්නට ලැබුණු සියයට 8·4 ට ඉතා සමීප වේ. තවද, එය ඉකුත් දශකය තුළ දක්නට ලැබුණු සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය දෙගුණයකින් ඉක්මවයි. මෑත වර්ෂවලදී මෙරට ආර්ථික ප්‍රගතිය ආර්ථිකයෙහි අංශ ස්වල්පයකට පමණක් සීමා වී තිබුණු අතර, අනිකුත් අංශ පිරිහෙමින් හෝ යථා තත්ත්වයේම පැවතුණි. එහෙත් 1978 දී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණය නම් පොදු වශයෙන් සෑම අංශයක්ම වාගේ දියුණුවක් පෙන්වීමයි.

නොකඩවා වසර දෙකක් තුල දියුණු වෙමින් පැවතුණු ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතය – එනම්, අපනයන මිල සහ ආනයන මිල සසඳන දර්ශකය – 1978 දී සුලු වශයෙන් පහත වැටුණි. එනම් අපනයන මිලට වඩා ආනයන මිල මට්ටම වැඩිවිය මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ ජාත්‍යන්තර තේ මිල පහත වැටීමයි. මෙම හේතුව නිසා 1977 වසරේ දිස්වුණු සුලු වෙළෙඳ වාසිය, බලාපොරොත්තු වූ පරිදි, 1978 දී තරමක අවාසියකට පෙරළුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගෙවුම් තුලණ (රටෙක විදේශ ගෙවීම් සහ ලැබීම් සැසඳීම) යෙහි වර්තන ගිණුම (විදේශ ප්‍රාග්ධන ගෙවීම් සහ ලැබීම් හැර, ඉතිරිවන තත්කාලීන විදේශ ගෙවීම් සහ ලැබීම් සැසඳීම) ඉකුත් වසරේ වාසිදායක තත්ත්වයේ සිට මෙවසර අවාසියකට පෙරලුණි. එහෙත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු අනිකුත් විදේශ ආයතන සහ රටවලින් ලැබුණු විශාල ප්‍රාග්-ධන සම්භාරයක් නිසා සමස්ත ගෙවුම් තුලනය ශ්‍රී ලංකාවට වාසිදායක තත්ත්වයක් පෙන්විය. එසේ ලැබුණු සම්පත් අතිරික්තය නිසා මෙරට විදේශීය වත්කම් තුන්වැනි වරටත් ඉහළ නැංගේය. එම වත්කම් ප්‍රමාණය 1979 වසරෙහි බලාපොරොත්තු වන ආනයන ප්‍රමාණයෙන් සිව් මසක ආනයන සඳහා සෑහේ.

මෙසේ විදේශ වත්කම් ඉහළ නැඟෙන විට මෙරට ආර්ථිකයෙහි මූල්‍ය ප්‍රසාරණය (මහ ජනයා අතැති මුදල් ප්‍රමාණයේ වැඩිවීම) ක් ඇතිවේ. එහෙත් රාජ්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය නිසා ඇතිවුණු මූල්‍ය සංකෝචනය (මහජනයා අතැති මුදල් ප්‍රමාණය අඩුවීම) ක් නිසා එය තරමක් දුරට මඟ හැරුණි. මේ හා 1978 වසර තුළ අනුගමනය කළ දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය නිසා, දේශීය මුදල් සැපයුමෙහි (මහජනයා අතැති කාසි මුදල් සහ ඉල්ලුම් තැන්පතු ප්‍රමාණයෙහි) වැඩිවීම සියයට 11 කට සීමා කරගත හැකි විය. සසඳන විට, ඉකුත් දෙවසරෙහි දක්නට ලැබුණු මුදල් සැපයුමෙහි වර්ධනය සියයට 29 ක් සහ සියයට 35 ක් විය. මෙම හේතූන් නිසා සහ 1978 වසරේ ඇතිවූ නිෂ්පාදන ප්‍රගතිය නිසා, දේශීය ආර්ථිකයෙහි දක්නට ලැබුණු උද්ධ-මනකාරී (මිල මට්ටම වැඩි කිරීමට රුකුල් දෙන) බලපෑම් ඉකුත් වසරේ පැවති මට්ටමට වඩා අඩුවෙන් පවත්වා ගැනීමට හැකි විය. පොදු (රජයට හෙවත් මහජනයාට අයත්) අංශයෙන් පිටත, මූර්ත වැටුප් (මුදලින් ලැබෙන නාමික වැටුප් වලින් මිල මට්ටමේ වැඩිවීම හරකළ විට මූර්ත වැටුප් ගිණිය හැකිය.) 1978 වසරේදී වැඩි වූ බව පෙනේ. තවද, ආර්ථික ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු ප්‍රගතිය නිසා මෙතෙක් වැඩෙමින් පැවති සේවා වියුක්තියෙහි (රැකීරක්ෂා අහේනියෙහි) සුළු අඩුවීමක් ඇතිවූ බව පෙනේ.

මෙම වසර තුළ ආර්ථිකයෙහි ඇතිවූ විශිෂ්ට පුනර්ජීවය 1977 වසරෙහි දී ඇරඹූ නව ආර්ථික ප්‍රතිපත්තීන් නිසා ඇති වූ බව පෙනේ. නව ආර්ථික ප්‍රතිපත්ති මාලාවේ පදනම වූයේ ශ්‍රී ලංකා රුපියල සඳහා තාත්වික හෙවත් යථාර්ථවාදී විදේශ විනිමය අනුපාතිකය (රුපියල සහ විදේශ මුදල් හුවමාරු වන අනුපාතය) ක් ඇති කිරීමයි. ඊට පෙර දැඩි වෙළෙඳ සහ ගෙවුම් පාලනයන් මඟින්, රුපියල අධි ප්‍රමාණ වූ අගයකින් පවත්වා ගෙන යාමට ප්‍රයත්න දරන ලදී.

එමනිසා උද්ගත වූ මිල මට්ටමේ විෂමතාවයන් නව පිළිවෙතින් දුරු කරන්නට බලාපොරොත්තු විය. පෙර පැවති බහු විනිමය අනුපාතික ක්‍රමය ඒකාබද්ධ කොට රුපියල වෙළෙඳපළේ පාවීමට හරින ලදී. මේ නිසා, වෙළෙඳපළේ පැවතුණු වෙළෙඳ හා ගෙවුම් පාලනයන් රැසක් ලිහිල් කිරීමට හැකි විය. දේශීය ව්‍යාපාර ආරක්ෂාකර ගැනීමට ආනයන සීමා කිරීම් වැනි ප්‍රමාණාත්මක සීමා වෙනුවට තීරුබදු යොද ගැනීමට හැකි විය. මෙසේ වෙළෙඳම ලිහිල් කිරීමෙන් දේශීය ව්‍යාපාරයන්හි පුනර්ජීවයක් බලාපොරොත්තු විය.

අමුද්‍රව්‍ය හා යන්ත්‍ර ආනයන යෙන් නිෂ්පාදන ධාරිතාව (හැකියාව) දියුණු කිරීමෙන් සාධාරණ ලෙස දේශීය නිෂ්පාදනය ආරක්ෂා වෙන තීරුබදු යටතේ ව්‍යාපාර අතර කැරෙන ආනයනයන්ගෙන් ඇති වන තරගයෙන් සහ දේශීය ඇතිවන තරගයෙන් මෙසේ දියුණුවක් අපේක්ෂා කරන ලදී. ඒ අතර, නව විනිමය අනුපාතිකය මගින් අපනයන කිරීමට මහත් රුකුලක් දීමට අදහස් කරන ලදී. විශේෂයෙන්ම, එමගින් දේශීය වෙළෙඳපලට සීමාවුනු කර්මාන්තයන් අපනයනයෙහි යෙදෙන්නට දිරි ගැන්වේ යයි බලාපොරොත්තු වුණි. තවද, දේශීය ගොවිතැනෙහිදී, නව විනිමය අනුපාතිකය නිසා නිෂ්පාදනය වැඩි කිරීමට උනන්දුවක් ඇතිවේ යයි අපේක්ෂා කරන ලදී. සාමාන්‍ය වශයෙන්. පෞද්ගලික අංශය දිරි ගන්වන ලදී. පොදු අංශයට ලැබුණු විශේෂ වරප්‍රසාද අවසන් කිරීමට අදහස් කරන ලදී. පෞද්ගලික අංශයේ වේවා, පොදු අංශයේ වේවා, ඒකාධිකාර (නිෂ්පාදනයෙහි තනි අයිතියක් හෝ බලයක් ඇති ව්‍යාපාර) සීමා කිරීමට අදහස් කැරුණි. වෙළෙඳ පළෙහි තරඟකාරීත්වය වැඩි වෙන විට මිල පාලන වැනි පාලනක්‍රම ඉවත් කිරීමට බලාපොරොත්තු විය.


විශේෂයෙන්ම මෙරට දුලබ තාක්ෂණික ඥනය ලබා ගැනීමටත්, නව අපනයන වෙළෙඳපල සොයාගැනීමටත්, විදේශ ආයෝජනයන්ට ආරාධනා කරන ලදී. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ පිහිටුවන "අපනයන සැකසුම් ප්‍රදේශ" වලට මෙම විදේශ ආයෝජන ඇද ගැනීම නව ප්‍රතිපත්තිවල වැදගත් අංගයක් විය. මෙරට උද්ධමනකාරී බලවේග සමහන් කරන්නට බලාපොරොත්තු වූයේ මිල සීමා කිරීම වැනි පාලන ක්‍රමවලින් නොව, අරපිරිමසින මූල්‍ය (මුදල් ප්‍රමාණය සීමා කෙරෙන) හා රාජ්‍ය මූල්‍ය (ප්‍රසාරණාත්මක නොවන අයවැය ලේඛන මගින්) ප්‍රතිපත්තීන් සහ තරඟකාරී වෙළෙඳපලක් ඇතිකිරීමට ගන්නා ප්‍රතිපත්තීන් වලිනි. සංවර්ධනයට අවශ්‍ය වැඩි සම්පත් සම්භාරයක් සොයාගැනීමට බලාපොරොත්තු වූයේ ඉතුරු කරන්නන්ට උද්ධමන වේගය ඉක්මවන උසස් පොළී ප්‍රමාණයන් ගෙවීමෙනි. කෙටිකාලීන උද්ධමනය සමහන් කිරීම සඳහා කෙටිකාලීන පොළී අනුපාතිකයන් වැඩි කරන ලද අතර දිගු කාලීන අනුපාතිකයන් පෙර පැවති මට්ටමේම පවතින්නට ඉඩ හරින ලදී.

රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිපත්තිය වූයේ අයවැය හිඟයන් තුරන් කිරීමත්, රජයේ වියදම් සඳහා ප්‍රසාරණාත්මක බලපෑම් ඇතිකරන බැංකු ණය ගැනීමෙන් වැළකීමත්ය පාරිභෝගික සහනාධාර ඉතා දිළිඳු කොටසකට පමණක් සීමා කිරීමෙන් දේශීය සම්පත් පාරිභෝජනයෙන් ආයෝජනයට හැරවීමට අපේක්ෂා කරන ලදී. ජනයා ඉතුරු කිරීමට සහ ආයෝජනය කිරීමට උනන්දු කරනු වස් බදු ක්‍රමය සංශෝධනය කිරීමට බලාපොරොත්තුවිය. දේශපාලන හා ආර්ථික ස්ථායීතාවයක් ඇතිකොට ආයෝජනය වැඩි දියුණු කිරීමට අදහස් කරන ලදී. ආනයන ලිහිල් කිරීමෙන් වැඩිවන ආනයන සහ ඉක්මනින් අපනයන නැංවීමට ඇති දුෂ්කරතාවය නිසා, ආර්ථික ක්‍රමයට නව හුරුවක් ඇතිකිරීමට බලාපොරොත්තුවන කාලසීමාවේදී උද්ගත වියහැකි ගෙවුම් තුලන අවාසි පියවා ගැනීමට අදහස් කරන ලද්දේ වැඩි වැඩියෙන් විදේශ ආධාර ලබා ගැනීමෙනි. සමස්තයක් වශයෙන් ගත් කල, නව ආර්ථික ප්‍රතිපත්ති, ඊට පෙර පැවති ප්‍රතිපත්ති වලට වඩා හාත්පසින්ම වෙනස් වේ. පෙර ප්‍රතිපත්ති දේශීය වෙළෙඳපලට නැඹුරු විය ; මහජන සහනාධාර වලට ප්‍රධාන තැනක් දුනි; ඒ සඳහා ආර්ථිකය දැඩි ලෙස පාලනය වුනි. නව ප්‍රතිපත්ති යටතේ ආර්ථිකය විදේශ වෙළෙඳපලට නැඹුරු වුනි ; ශුභසාධනයට වඩා ආර්ථික වර්ධනය කෙරෙහි සැළකිල්ලක් දක්වුනි ; පාලනයෙන් තොර නිදහස් වෙළෙඳපලක් බිහි කිරීමට බලාපොරොත්තු වුනි.

පවත්නා වෙළෙඳපල මිල අනුව, 1978 වසරේ දළ ජාතික නිෂ්පාදිතය (නිපදවූ භාණ්ඩ හා සේවාවන්හි මුළු වටිනාකම) ඉකුත් වසරට වඩා සියයට 24 කින් වැඩි විය. මෙම ගණනින් මිල මට්ටමේ නැගීම හර කළ විට, මූර්ත හෙවත් නියම ආර්ථික වර්ධන වේගය සියයට 8·2 කි. මෙරට ජන සංඛ්‍යාව 1978 දී සියයට 1·7 කින් වැඩිවී ඇත. ඒ අනුව, ඒක පුද්ගල මූර්ත

# දළ ජාතික නිෂ්පාදිතය

පවත්නා සාධක වියදම් මිල අනුව
වාර්ෂිකව





ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

# කාර්මික සමාරම්භය අනුව දළ ජාතික නිෂ්පාදිතය

පවත්නා සාධක පිරිවැය මිල අනුව
වාර්ෂිකව




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

නිෂ්පාදිතය සියයට 6·4 කින් ඉහළ ගියේය. මෙය ඉකුත් වර්ෂයේ වර්ධන වේගය වූ සියයට 2·6 හා සැසඳේ. පවත්නා මිල අනුව ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය 1977 දී රුපියල් 2,095 ක් විය; මෙම වසරේදී එය රුපියල් 2,549 දක්වා දියුණු විය.

ඉකුත් වසරේ ඇතිවූ ආර්ථික ප්‍රගතියෙන් හරි අඩකටම වගකීවේ කෘෂිකර්ම අංශයයි. එහෙත් 1978 ප්‍රගතියෙන් ගොවිතැන වගකීවේ සියයට 17 කට පමණි. එයින් පෙනෙනුයේ 1978 වසරේ ප්‍රගතිය නොයෙකුත් අංශ රාශියක් අතර බෙදී ගොස් ඇති බවයි. ඉදිකිරීම් අංශය සියයට 16 කට වගකීය. වෙළෙඳ අංශය සියයට 14 කටත්, කර්මාන්ත අංශය සියයට 13 කටත්, කැණීම් සහ ආකර අංශය සියයට 11 කටත්, ''වෙනත් සේවා'' සියයකට 10 කටත් වගකියා ඇත. මෙම ප්‍රගතිය ඇතිවූයේ ප්‍රධාන වශයෙන් 1977 නව ආර්ථික ප්‍රතිපත්තීන් නිසා බව පෙනේ. වෙළෙඳ අංශයේ දියුණුව වැඩියෙන්ම ඇතිවූයේ ආනයන ලිහිල් කිරීම නිසාය. කෘෂිකර්මයෙහි ප්‍රගතිය ඇතිවූයේ රබර් සහ පොල් මිල වැඩිවී නිෂ්පාදකයන්ගේ ලාභ වැඩිවීම සහ එසේම, වී වගාවෙහි යෙදුණු ගොවීන්ට වැඩි මිලක් ලැබුණු නිසා බව පෙනේ. ඉදිකිරීම් සහ කැණීම් අංශයන්හි ප්‍රගතිය ඇතිවූයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ඇතිවුනු විශාල දියුණුව නිසයි. වෙළෙඳ පළ නිදහස් කිරීම සහ ආයෝජන වාතාවරණය දියුණුවීම නිසා ඉදිකිරීම් සෑහෙන ලෙස දියුණු වූ බව හැඟේ.

කෘෂිකර්ම අංශයේ වර්ධන වේගය 1977 දී සියයට 7 ක් ව පැවති නමුත්, 1978 දී සියයට 4 දක්වා පසු බැස්සේය. සියයට 34 කින් පසුගිය අවුරුද්දේ වැඩිවුණු වී නිෂ්පාදනය, මෙම වසරේදී තවත් සියයට 13 කින් පෙරට ගියේය. මුළු නිෂ්පාදනය බුසල් දශලක්ෂ 91 ක් විය. එය වාර්තාගත අස්වැන්නකි. මේ නිසා පසුගිය වසර තුළ සහල් ආනයනය අඩුකර ගතහැකි විය. මහ සහ යල් කන්නයන්හිදී ලද අස්වැන්න ඉකුත් වසරේ අස්වැන්නට වඩා, පිළිවෙලින්, සියයට 12 ක් හා 13 ක් වැඩි බව පෙණුනි. මෙම වාර්තාගත අස්වැන්න ලැබුනේ යහපත් කාලගුණය, වැඩියෙන් පෝර යෙදීම, වැඩියෙන් ගොවි ණය ලැබීම සහ මිල මට්ටම හොඳින් පැවතීම නිසයි. එහෙත් පසුගිය අවුරුද්දේ පෙරට ගිය තේ නිෂ්පාදනය මෙම අවුරුද්දේ සියයට 5 කින් පසුබට විය. ඉකුත් අවුරුද්දේ සියයට 4 කින් පහත වැටුණු රබර් නිෂ්පාදනය මෙවර, හොඳ මිල ලැබුණු නිසාම, සියයට 7 ක ප්‍රගතියක් පෙන්වීය. යහපත් කාලගුණය සහ පෝර යෙදුම දියුණුවීම නිසා පොල් නිෂ්පාදනය සියයට 21 කින් වැඩි වී ඇති බව පෙනේ. සුපුරුදු සුළු අපනයන භෝග ගැන විශේෂයක් දක්නට නොලැබුණි. වෙනත් ආහාර භෝග නිෂ්පාදනයෙහි පසුබට වීමක් පෙණුනි. මාළු නිෂ්පාදනය වැඩිවූ අතර, සත්ව නිෂ්පාදනය අඩු විය. සමස්තයක් වශයෙන් ගත් කල කෘෂිකර්මයේ දියුණුවක් ඇති වුවද, නොයෙක් අංශ අතර ඒකාකාර ප්‍රවනතාවයක් දක්නට නොලැබුණි.

මෙම වාර්තාවේ පසු පිටුවල විස්තර කර ඇති පරිදි, විශේෂයෙන්ම තේ නිෂ්පාදනයෙහි සහ පොදු වශයෙන් අපනයන කෘෂිකර්මයෙහි ඇතිවූ අසමාන ක්‍රියාකාරිත්වය ඉදිරියට විශාල ප්‍රශ්නයක් වනු ඇත. මෙම අංශයට පණ ගැන්වීම නව ආර්ථික ප්‍රතිපත්තීන් අතර වැදගත් අංගයක් විය යුතුය. එසේම, ඉදිරියට බලාපොරොත්තු වන ආර්ථික ව්‍යුහයේ ප්‍රතිසංස්කරණය සාර්ථක කර ගැනීමටත් දැනට ලබා ගන්නා ණය මුදල් වැඩිකල් නොගොස් ආපසු ගෙවීමටත් මෙම අංශයෙන් උපයා ගතහැකි විදේශ ආදායම් ඉතා වැදගත් වනු ඇත. තවද, රාජ්‍ය අංශයේ ආයෝජන අවශ්‍ය උසස් මට්ටමින් පවත්වා ගෙන යාමට නම් මෙම අංශයෙන් ඒ සඳහා බදු ආදායම් ලබාගත යුතු වේ. එපමණක් නොව, අපනයන ආදායම් වැඩි කර ගැනීමට මෙම අංශය ඉතා වැදගත් වනු ඇත. එමනිසා, විශේෂයෙන්ම අපනයන බදු බර සලකමින් නිෂ්පාදනයන්ට ලැබෙන ලාභ, නිෂ්පාදන වියදමෙහි දක්නට ලැබෙන ප්‍රවනතාවයන් සහ පවත්නා පාලනයන් තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ගැන විශේෂයෙන් පරීක්ෂාකාරී විය යුතුය.

දේශීය කෘෂිකර්ම අංශයේ නිතර මතුවන සදකාලික සුපුරුදු ප්‍රශ්නයක් 1978 වසරෙහිද ඉස්මතුව පෙනුනි. එනම්, පාරිභෝගිකයාට ''සාධාරණ'' යැයි සැලකෙන වෙළෙඳපල මිල පවත්වාගෙන යාමේ අභිලාෂයත්, නිෂ්පාදකයා අධෛර්යමත් නොකෙරෙන සාධාරණ ලාභ ලබාදෙන මිල මට්ටමක් පවත්වාගෙන යාමේ අභිලාෂයත් අතර ඇති උභතෝකෝටික ප්‍රශ්ණ

යයි. පාරිභෝගිකයාට සහනදායී මිලකට තිරිඟු පිටි වෙළෙඳපලෙහි සුලභ කිරීම නිසා සුළු ආහාර බෝග වගාව පසුබටට වූ බව පෙනෙන්නට තිබේ. කාලීන වශයෙන් ගොවි නිෂ්පාදන වෙළඳපලට එන නිසා ඇතිවන මිල මට්ටමේ විශාල උස් පහත්වීම් සමහන්කරනු සඳහා රජය විසින් බෝග තොග රැස්කර, ඒවා අහේනි කාලයන්හිදී වෙළඳපලට නිකුත් කර මිල ස්ථායීකරණය ඇති කිරීම නිසා යම් හෙයකින් නිෂ්පාදක මිල අවාසිදයක වුවහොත් නිෂ්පාදකයන් දිරි ගැන්වීමක් සිදුනොවනු ඇත. එමනිසා, පාරිභෝගික හා නිෂ්පාදක අවශ්‍යතා අතර ඇති මෙම ගැටලුවට විසඳුමක් අවශ්‍යව ඇත.

ආනයනය ලිහිල්කරණයෙන් උකටලීව පැවතුන ශ්‍රී ලංකාවෙ කර්මාන්තයන්ට විශාල දිරිගැන්වීමක් ඇතිවිය. ලොකු සහ කුඩා කර්මාන්ත අංශයේ නිෂ්පාදන වටිනාකම 1978 වසරේදී සියයට 11 කින් වැඩි දියුණු වූ බව ගණන් බලා ඇත. පොදු අංශයට වඩා පෞද්ගලික අංශය සුළු වශයෙන් පෙරට ගොස් තිබේ. වැඩියෙන් වර්ධනය වී ඇත්තේ මූලික ලෝහ, රෙදි පිළි (ලෝහ නොවන) ඛණිජ කඩදසි සහ රසායනික ද්‍රව්‍ය අංශයන්ය. රෙදිපිළි අංශයේ විශාල කම්හල්වල නිමැවුමෙහි ප්‍රගතිය කුඩා කම්හල්වල පසුබැසීම මකාලීමට සමත්වූ බවක් පෙනේ. එහෙත් මේ නිසා මෙ අංශයේ සේවා නියුක්තිය ද අඩු වීමට ඉඩ ඇත්තේය. මෙම තත්ත්වය උද්ගතවී ඇත්තේ හුදෙක් ආනයන ලිහිල්කරණය නිසාම නොව, අඩු තීරුබදු යටතේ රජය රෙදිපිළි ආනයන කොට අඩු මිලට ජනප්‍රිය රෙදිපිළි වර්ග වෙළඳපලට සැපයීම නිසාය. සමහර ආහාර, ලෝහ සහ යන්ත්‍ර නිෂ්පාදකයන්ට අපමණ තීරුබදු ආරක්ෂාව සපයා තිබියදී ආනයන යන් සමග තරග කිරීමට දුෂ්කර බව පෙනුනි. එමනිසා, කාර්මික ප්‍රතිපත්තිය නැවත පිරික්සීමට කාලය එළඹී තිබේ. මූලික වශයෙන් අකාර්යක්ෂම වූ කර්මාන්ත දිගින් දිගටම ආරක්‍ෂා කිරීමෙන් ආර්ථික වාසියක් ලැබෙන්නේ නැත. මෙරට කර්මාන්ත විදේශ වෙළඳ පලට අපනයනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය සාර්ථක වන්නට නම් ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී ඉතා කාර්යක්‍ෂම කර්මාන්ත බිහි කළයුතුය. ඒ අතර මෙවසර මුලදී පොදු අංශයේ කර්මාන්ත සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. එහෙත් කල්යත්ම මෙම උනන්දුව හීනවන බවක් පෙනෙන්නට තිබුණි. සිමෙන්ති, පිඟන් භාණ්ඩ වැනි පොදු කර්මාන්තයන්ට තවමත් ඒකාධිකාරී බලතල තිබෙන බව පෙනේ. පරන්තන් රසායන සංස්ථාවට මෙරටට කෝස්ටික් සෝඩා ආනයන කිරීමේ පවා ඒකාධිකාරයක් ඇත්තේය. වැඩි තරඟකාරීත්වයක් ඇති කළහොත් වාසි ඇතිවේදැයි සොයා බැලීම සඳහා තවදුරටත් පොදු කර්මාන්තයන්ට ඒකාධිකාරී බලතල පැවරීමේ ප්‍රතිපත්තිය විමර්ෂණය කළ යුතුව ඇත. තවද මිල නියම කිරීමේ හා නිෂ්පාදනය තීරණය කිරීමේදී පොදු සංස්ථාවට දැනට වඩා වැඩි නිදහසක් පවරාදීම යෝග්‍ය විය හැකිය.

මෙරට ගමනාගමන සහ පණිවුඩ හුවමාරු සේවාවන්හි කාර්යක්‍ෂමභාවය පසුබැස ඇති බව පෙනේ. පොදු බස් සේවාවන්හි ක්‍රියාත්මක වූ සේවා සැපයුම් ප්‍රමාණය, අවශ්‍ය ප්‍රමාණයට වඩා සියයට 18 කින් අඩු බව පෙනේ. බස්ගාස්තු 1978 වසරේදී වැඩි කරන ලද නමුත්, මෙම සංස්ථාවෙහි මුදල් තත්ත්වය දියුණු වී ඇති බවක් නොපෙනේ. විමධ්‍යගත කිරීමෙන් සේවාවෙහි දියුණුවක් තවම පෙනෙන්නට නැත. සමහර ගම්බද ප්‍රදේශවල පොදු සේවාවන්ට අතිරේකව පෞද්ගලික සේවාවන්ට අවසර දීමට අදහස් කෙරේ. එහෙත් දුර්වල ප්‍රවාහණ සේවා වැඩියෙන් පවතින්නේ නගර තුළ ගමනාගමනයෙහිය. වැඩිවන ප්‍රවාහණ ඉල්ලුමට සරිලන බස් සේවා සැපයීමට නොහැකිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ නියමිත ඉතා අඩු බස් ගාස්තු ක්‍රමයක් යටතේ සේවා පවත්වාගෙන යාමේදී ඉස්මතුවන මූල්‍ය පාඩු නිසා ගමනාගමන සේවාවන් සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය යෙදවීමට නො හැකි වීමයි. අනික් අතට, දැනට ඇති තොරතුරු වලින් විදහා දක්වෙන්නේ දුම්රිය සේවයත් ක්‍රමානුකූලව දුර්වල වී ඇති බවයි. ජාත්‍යන්තර ඉන්ධන තෙල් මිල වැඩිවීම නිසාත්, ආර්ථික සංවර්ධනය හේතුකොට ගෙන පොදු ගමනාගමන සේවා සඳහා ඇති ඉල්ලුම තව තවත් වැඩි වන නිසාත් ගමනාගමනය සඳහා දැනට වඩා වැඩි ආයෝජනයක් අවශ්‍ය වේ. පොදු ප්‍රවාහණ සේවා මිල (ගාස්තු) යථාර්ථවාදී ලෙස නියම කළ යුතුව තිබේ. ගමනාගමන සේවාවන්හි හැසිරවීම හෙවත් කළමනාකරණය බොහෝ සේ දියුණු කළ යුතුව තිබේ. ඒ අතර භාණ්ඩ ප්‍රවාහනයෙහි (ලොරි සේවාවන්හි) සැලෙන දියුණුවක් 1978 වසරේ දී දක්නට ලැබුණි. ආනයන ලිහිල් කරණය නිසා

1978 වසරේ දී ලොරි සහ වෑන් 4874 ක් ලියා පදිංචි කොට තිබේ. මෙය 1976 න් අවසන් වන අවුරුදු පහක් තුළ ලියා පදිංචි කරන ලද එම වාහන මෙන් දෙගුණයකටත් වැඩි ප්‍රමාණයකි. මේ නිසා උද්ගත වූ තරඟකාරිත්වය නිසා ලොරි කුලී ගාස්තු බොහොමයක් සියයට 10 සිට 20 දක්වා පහත වැටුණු බව පෙනේ. තවද, පසුගිය කාලපරිච්ඡේදයේදී අවශ්‍ය ආයෝජනයෙන් වැලකීම නිසා දේශීය පණිවුඩ හුවමාරු සේවා අබලන් වී ඇත. කාර්යක්‍ෂම ගමනාගමන සහ පණිවුඩ හුවමාරු සේවා ආර්ථික ප්‍රගතියට ඉතාමත්ම අවශ්‍ය වේ.

කලින් බලාපොරොත්තු වූ පරිදි, ශ්‍රී ලංකාවේ වෙළඳ සහ ගෙවුම් තත්වය 1978 වසරේදී අවාසිදායක තත්ත්වයක් පිළිබිඹු කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන සියයට 23 කින් වැඩි වීමත්, අපනයන ඉතා සුළුවෙන් වැඩිවීමත් ය. වෙළඳ තුලනයේ (ආනයන සහ අපනයන සැසඳීමේ) අවාසිය රුපියල් 214 කෝටියකි. (වි.හැ අ. 13 කෝටි-යකි)* සේවා අංශයේ (එනම්. වරාය, රක්‍ෂණ හා ගමන් සේවා) පැවති අතිරික්තය අඩු වූයේ ව්‍යාපාර, අධ්‍යාපනය, අපනයන ප්‍රචාර සහ වෙනත් කරුණු සඳහා ඇති වූ විදේශ ගමන්-වලට වැය වුනු වැඩි මුදල නිසාය. එහෙත් සංක්‍රාම (එනම්, භාණ්ඩ සහ සේවාවන්ට කෙරෙන ගෙවීම් සහ ලැබීම් හැර, වෙනත් ඒකපාක්ෂික ගෙවීම් හා ලැබීම්) යන්හි ශුද්ධ ලැබීම් අතිරික්තයේ විශාල වැඩිවීමක් පෙනුනි. මෙසේ වූයේ මැද පෙරදිග වැනි ප්‍රදේශවල රැකියාවන්හි නියුක්ත ලාංකිකයන් විසින් මෙරටට එවන මුදල්වල සැලකිය යුතු වැඩිවීමක් නිසාය. මේ හේතුවෙන්, ගෙවුම් තුලනයේ වර්තන ගිනුම රුපියල් 78 කෝටියක (වි.හැ.අ. 6 කෝටියක) අවාසියක් පෙන්නුම් කළේය. එහෙත් විදේශයන්ගෙන් ලැබුණු ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් රුපියල් 56 කෝටියක (වි.හැ අ. 5 කෝටියක) සිට රුපියල් 264 කෝටියක් (වි.හැ.අ. 14 කෝටියක්) දක්වා ශීඝ්‍ර ලෙස වැඩි වූ නිසා වර්තන ගිණුම අවාසිය මැකී ගියා පමණක් නොව, මෙරට විදේශ වත්කම් රුපියල් 190 කෝටියකින් (වි.හැ.අ. 7 කෝටියකින්) වැඩි වූයේය.

ඉකුත් වර්ෂයේ දී මෙන්, ගෙවුම් තුලනයේ අතිරික්තය නිසා දේශීය බැංකුවල විදේශීය වත්කම ඉහළ ගියේය. එහෙත් මේ නිසා උද්ගතවන ප්‍රසාරණික බලපෑම, රාජ්‍ය අංශයේ සංකෝචණික බලපෑම නිසා තරමක් දුරට සමහන් විය. එම නිසා 1978 වසරේ දී මුදල් සැපයුමේ වැඩිවීම සියයට 11 කට සීමා කරගත හැකි විය. මෙය ඉකුත් වසරවල පැවති සියයට 29 ක හා 35 ක මුදල් සැපයුමේ වැඩිවීම හා සැසඳේ. පෞද්ගලික අංශයට දෙන ලද ණය මුදල් ප්‍රමාණය සීමා කිරීම, කෙටි කාලීන පොලී ප්‍රමාණයන් ආදියෙන් සමන්විත තියුණු මූල්‍ය ප්‍රතිපත්තියක් 1978 වසර තුල ද ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව, පොදු සංස්ථා-වන්ට දෙනු ලබන ණය මුදල් ප්‍රමාණය ද සීමා කරන ලදී. මෙවැනි තියුණු මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය නො කරන්නට, රටේ ආර්ථික ප්‍රගතියට අත්‍යවශ්‍ය ආර්ථික ස්ථායීතාවයක් නැවත ඇති කිරීමට දුෂ්කර වනු ඇත. ණය මුදල් සඳහා ගෙවිය යුතු පොලී ප්‍රමාණයන් වැඩි බව සමහර අය චෝදනා කර ඇත. එහෙත් නව මූල්‍ය ප්‍රතිපත්ති අවබෝධ කරගත යුත්තේ පුරා අවුරුදු දෙකක් තුළ පැවති විශාල මුදල් ප්‍රසාරණයක් සමහන් කොට නැවත මෙරට මූල්‍ය ස්ථායීතාවයක් ඇති කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද, උද්ධමන විරෝධි කෙටිකාලීන ප්‍රතිපත්ති මාලාවක් ලෙසයි. වෙනත් අයුරකින් පවසුනහොත් නම්, මෙරට සංවර්ධනයට අත්‍යවශ්‍ය සම්පත් ඉතිරිකර ගන්නට නම්, ඉතිරි කරන්නන්ට පවත්නා හෝ බලාපොරොත්තු-වන උද්ධමන වේගයට වඩා වැඩි මිලක් එනම්, පොලී ප්‍රමාණයක්—ගෙවිය යුතු වේ. දැනට පවත්නා උද්ධමන වේගය සියයට 15 ක් පමණ හෙයින්, පෙර කල පැවති අඩු පොලී ව්‍යුහය-කට ආපසු යෑම නිෂ්ඵලදායී කාර්යයක් වනු ඇත. 1978 වසරේ පැවති විශාල ණය මුදල් ඉල්ලුම දෙස බලන විට, වැඩි පොලී ප්‍රමාණයක් නිසා ණය ගැනුම්කරුවන් හා ආයෝජකයින් පසුබට

* "විශේෂ හැරගැනීමේ අයිතිවාසිකම්" (වි.හැ.අ.) යනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හඳුන්වා දෙනු ලැබූ ජාත්‍යන්තර සංචිත වත්කමක් හෙවත් එක්තරා 'මුදල්' විශේෂයකි. ලෝකයේ ප්‍රධාන මුදල් වර්ග වල වටිනාකම අනුව එහි වටිනාකම නියම වේ. ලෝකයේ මුදල් වර්ගවල වටිනාකම සෑහෙන ලෙස උස් පහත්වුනු, එම නිසා ශ්‍රී ලංකාවේ රුපියලේ ජාත්‍යන්තර අගය වෙනස්වුනු නූතන කාලයේ වෙළඳ සහ ජාත්‍යන්තර ගෙවීම් සංසන්දනය කිරීමේ දී රුපියල පාවිච්චි කිරීම උචිත නොවේ. එම නිසා, එතරම් උස් පහත්වීමක් නොපෙන්වූ වි.හැ.අ. වටිනාකම් යෙදීම මැනවි.

වී නැති බව පෙනේ. එහෙත්, වැඩි පොළී ප්‍රමාණයන් නිසා දිගු කල් ආයෝජකයින් උකටලී විය හැකිය. මේ හේතුව නිසයි, 1977 ප්‍රතිපත්ති සංශෝධනයේ දී දිගුකාලීන පොළී ප්‍රමාණ වැඩි නොකරන ලද්දේ. 1979 දී ණය දීම අරඹන ජාතික සංවර්ධන බැංකුව පිහිටුවන ලද්දේත් වැඩියෙන් දිගුකාලීන ණය මුදල් සැපයීමටයි.

ඉකුත් 1977 වර්ෂයේ දී ඇතිවූ ආර්ථික සංශෝධනවල ප්‍රතිඵලයක් වශයෙන් රජයේ අයවැය ලේඛනයෙහි ආදායම සහ වියදම සැහෙන ලෙස වැඩි විය. එහෙත් බලාපොරොත්තු වූ වර්තන අයවැය අතිරික්තය සාක්ෂාත් කරගත නොහැකි විය. එනම්, රජයේ ආදායමත්, වර්තන (ප්‍රාග්ධන නොවන) වියදමත් අතර වෙනස රුපියල් 70 කෝටියක හිඟයකි. මෙම වසරේ රාජ්‍ය මූල්‍ය ක්‍රියාවන් නිසා පෙනෙන්නේ රුපියල් 17 කෝටියක ප්‍රසාරණයකි. එහෙත් මෙය බැංකු හා මූල්‍ය අංශයෙන් පෙන්වන රජයේ රුපියල් 150 කෝටියක සංකෝචනාත්මක බලපෑමට හාත්පසින්ම විරුද්ධය. මෙම තත්ත්වය උද්ගත වූයේ වසර අවසානයේදී රජය විසින් කරන ලද එක්තරා මුදල් සංක්‍රාමයන් හෙවත් පැවරීම් නිසාත්, වෙනදාට වඩා විශාල ගෙවීම සඳහා ඉදිරිපත් කර නැති මුදල් ඇනවුම් හෙවත් චෙක්පත් සම්භාරයක් නිසාත්ය. මේ සඳහා සංඛ්‍යා ගැලපූ විට පෙනෙන්නේ රාජ්‍ය අංශයේ අයවැය පරිහරණයේ රුපියල් 89 කෝටියක සංකෝචනයකි. අපේක්ෂිත ප්‍රාග්ධන වියදම්වලින් සියයට 16 ක් වියදම් කර නැත. මෙය ඉකුත් අවුරුද්දේ සියයට 27 හා සසඳන විට දියුණුවක් පෙන්වයි. එහෙත්, රජයේ කටයුතු 1979 සහ ඉදිරියට සැළකිය යුතු ලෙස වැඩෙන නිසා මීටත් වඩා උසස් ප්‍රාග්ධන වියදම් මට්ටමකට පිවිසෙන්නේ නම් මැනවි.

පසුගිය වසරේ දී සඳහන් කළ පරිදි 1977 වර්ෂය ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයෙහි පැහැදිළි සන්ධිස්ථානයකි. එම අවුරුද්දේ දී ශ්‍රී ලංකාව දේශීය අංශයට නැඹුරු වුනු, දළඳඬු ලෙස පාලිත සහ ශුභසාධනවාදී ආකල්ප ඉවත් කොට, විදේශීය අංශයට නැඹුරුවුනු නිදහස් තරඟකාරී සහ ආර්ථික සංවර්ධනවාදී ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කළේය. 1978 වර්ෂය මෙම නව ආර්ථික ප්‍රතිපත්ති යටතේ ප්‍රථම වර්ෂය විය. විශාල වශයෙන් පාලනය කරන ලද අර්ථක්‍රමයෙකින් නිදහස් තරඟකාරී ක්‍රමයකට පරිවර්තනය කිරීමේ දී නොයෙකුත් ගැටළු මතු විය. එහෙත්, නව ප්‍රතිපත්තිවලින් උද්දම වූ ආර්ථික ක්‍රමය උසස් ආර්ථික ප්‍රගති වේගයක් වාර්තාගත කිරීම 1978 වසරේ විශේෂ ලක්ෂණය විය. අපනයන සුළුවෙන් නැගුනේ, තේ කර්මාන්තයේ පසුබැස්ම සහ සාමාන්‍යයෙන් අපනයනයන් මෙවැනි දිරිගැන්වීම් නිසා නැග ඒමට කාලයක් ගත වන නිසාය. එසේ වුවද, තීරුබදු මගින් නව ප්‍රතිපත්තිවලින් උද්ගතවන වාසි සුපුරුදු අපනයන අංශයට සම්පූර්ණයෙන් නොලැබෙන නිසා එම අංශය — විශේෂයෙන්ම තේ, පොල් සහ සුළු අපනයන බෝග - දිරිගැන්වීමට ප්‍රතිපත්ති සංශෝධනයක් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ රුපියලේ අගය සංශෝධනය කිරීම, සමහර සහනාධාර කපා හැරීම, වේතන වැඩිකිරීම සහ ජාත්‍යන්තර වෙළඳපල පැවති උද්ධමනය නිසා ආනයන මිල වැඩිවීම තිබියදීත් මෙරට උද්ධමන වේගය පාලනය කරගත හැකිවීම විශාල ජයග්‍රහණයකි. තියුණු ප්‍රසාරණ විරෝධී මූල්‍ය ප්‍රතිපත්තීන්, වගකීමෙන් යුතුව රජයේ මුදල් පරිහරණය කිරීම, වැඩි වූ ආනයන, ආර්ථික ලිහිල්කරණය නිසා ඇතිවූ තරඟකාරී වෙළඳපල සහ පෙර නොවූ විරූ වී අස්වැන්නක් ලැබීම යන කරුණු නිසා දේශීය මිල මට්ටම කෙරෙහි බලපෑ උද්ධමනකාරී බලවේග තරමක් දුරට සමහන් කරගන්නට හැකි විය. එසේ වුවත් මිල මට්ටම ගැන හොඳින් පරීක්ෂාකාරී විය යුතුය. එසේ නොවුවහොත් නිෂ්පාදන වියදම් වැඩිවී ජාත්‍යන්තර වෙළඳ පලෙහි ශ්‍රී ලංකාවේ තරඟකාරීත්වය දුර්වල වනු ඇත.

1978 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබිඹු කළ සැළකිය යුතු ප්‍රගතිය ඇතිවූයේ මෙතෙක් කල් ඉතා සුළුවෙන් පෙරට ගිය ආර්ථිකය, පාලනය ලිහිල් කිරීම සහ මිල අනුසාරයෙන් ඇතිවූ දිරිගැන්වීම් යටතේ ඉබේම සහ ක්ෂණිකව ප්‍රසාරණය වූ නිසාය. මෙම ප්‍රගති වේගය ඉදිරියටත් පවත්වාගෙන යන්නට නම් දැනට වඩා ඉතිරි කිරීම් හා ආයෝජනත්, ආර්ථික ප්‍රගතියට රුකුල් දෙන ප්‍රතිපත්ති සංශෝධනත් අවශ්‍ය වන්නේය. පාරිභෝගිකයින්ගේ හා

නිෂ්පාදකයින්ගේ ශුභසාධනය ගැන ඉතා දුෂ්කර තීරණ ගැනීමට සිදුවනු ඇත. ඉතිරි වී ඇති ඒකාධිකාර බල සහ නිෂ්ඵල පාලන ඉවත් කිරීමට සිදුවනු ඇත. හුදෙක් ආර්ථික ප්‍රගතිය සඳහා ප්‍රතිපත්තීන් සකස් කරන විට, රටේ මහජනයා අතර ආදායම් බෙදීයෑම කෙසේ සකස් විය යුතුද යන්න ගැනත් තීරණයක් අවශ්‍ය විය හැකිය. එහෙත් 1978 ආර්ථිකය හැඩගැසුණු ආකාරය දෙස බලන විට එක් කරුණක් පැහැදිලිවම දක්නට ලැබේ. එනම්, උචිත ප්‍රතිපත්ති වාතාවරණයක් ඇත්නම්, නොකඩවා හා සීඝ්‍රලෙස වැඩෙන්නට ශ්‍රී ලංකා ආර්ථිකයට ශක්තියක් තිබෙන බවයි.

## ජාතික නිෂ්පාදිතය සහ ආදායම

පවත්නා සාධක වියදම් මිළ අනුව, 1978 දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 36,139 ක් ලෙස තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙය ඉකුත් වසරට වඩා සියයට 23.5 ක වැඩිවීමකි. මිළ වැඩිවීම සඳහා ගැලපූ ස්ථාවර (1959) මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 13,002 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. 1977 දී සියයට 4·4 ක් වූ වර්ධනය හා සසඳන කල, මෙයින් සියයට 8·2 ක වර්ධන වේගයක් පිළිබිඹු වෙයි. 1978 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය, ඉකුත් දශකය තුළ දක්නට ලැබුණු සාමාන්‍ය වර්ධන වේගය මෙන් දෙගුණයකටත් වඩා වැඩි වූ අතර, මෑත යුගයේදී ඇතිවූ ඉහළම වර්ධන වේගය වන, 1968 වර්ෂයේ සියයට 8·4 ට බොහෝදුරට සමාන විය. ආර්ථිකයේ ඉතිරි අංශ දියුණු නොවී හෝ පිරිහෙමින් තිබියදී ප්‍රධාන වශයෙන් අංශ කීපයක පමණක් ආර්ථික වර්ධනයක් දක්නට ලැබිණි. කලින් වර්ෂ වලදී මෙන් නොව, 1978 දී සියළුම අංශවල ඉහළ මට්ටමක ක්‍රියාකාරිත්වයක් තිබීම පැහැදිලි ලක්ෂණයක් විය. මින් කැපී පෙනෙන සුළු වර්ධනයක් දක්නට ලැබුණේ පතල් හා කැනීම්, තැනීම් කටයුතු, විදුලිය, මූල්‍ය, නිමවුම් කර්මාන්තය හා වෙළඳාම යන අංශ වලය.

1978 දී ශ්‍රී ලංකාවේ වසර මැද ජනගහනය එක් කෝටි හතලිස් දෙලක්ෂයක් වී යැයි තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මෙයින් සියයට 1·7 ක වාර්ෂික වර්ධනයක් පිළිබිඹු වෙයි. මේ අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය සියයට 6·4 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් මූර්ත වශයෙන් රු. 917 ක් විය. ඉකුත් වර්ෂයේදී මෙය වැඩි වී තිබුණේ සියයට 2·6 කිනි.

1976 දී හා 1977 දී ප්‍රධාන වශයෙන්ම අපනයන මිළ ගණන් තියුණු ලෙස ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් පිළිවෙලින් සියයට 35 කින් හා 31 කින් වර්ධනය වූ ශ්‍රී ලංකාවේ වෙළඳ අනුපාතය 1978 දී සුළු වශයෙන් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ අනුපාතයේ වෙනස්වීම් අනුව මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ගැලපීමෙන් සකස් කරගනු ලබන මූර්ත ජාතික ආදායම 1978 දී සියයට 7·8 කින් වැඩිවිය. මෙය මූර්ත ජාතික නිෂ්පාදිතයෙහි වර්ධන වේගයට වඩා අඩු වනුයේ සුළු වශයෙනි.

1978 දී පවත්නා වෙළඳ මිළ අනුව දළ ජාතික වියදම රුපියල් දශලක්ෂ 38,826 වී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1977 ට වඩා සියයට 25 ක වැඩිවීමකි. පාරිභෝජන වියදම සියයට 29 කින් වැඩි වූ අතර, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 65 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. පෞද්ගලික හා රජයේ පාරිභෝජනය සියයට 29 බැගින් සමාන අන්දමින් වැඩි වූ අතර ප්‍රාග්ධන සම්පාදනයෙහි ප්‍රධාන වැඩිවීම සඳහා රාජ්‍ය අංශය දායක විය. එසේ වුවද 1978 දී ඇති වූ මිළ වෙනස්වීම් ද මෙම සංඛ්‍යා වලට (විශේෂයෙන්ම ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ හේතුවෙන් උද්ගත වූ වැඩි ආනයන වියදම්) ඇතුලත් වන හෙයින් ඒවා ප්‍රවේශමෙන් සැලකිල්ලට ගත යුතුය.